www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයාගේ ප්‍රකාශය

# 2004 ජුලි හතර වන දා: ඇමරිකානු විප්ලවයේ 228 වන වසර

## The fourth of July, 2004: America's revolution 228 years on

**බිල් වැන් ඕකන් විසිනි**
**2004 ජුලි 03**

ජුලි හතර වන දිනය යලිත් අප වෙත පැමිනෙයි. වැඩ කිරීමෙන් හෙම්බත් වූ හා නිසි ගෙවීමක් නො ලබන දසලක්ෂ සංඛ්‍යාත ඇමරිකානුවන්ට මෙම දිනය ඔවුන්ගේ පවුල් සමග එක්ව සිටීමට කලාතුරකින් ලැබෙන අවස්ථාවන්ගෙන් එකකි. මහා ව්‍යාපාරික දේශපාලනඥයන්ට එය තරුවලින් හා පටිවලින් තමන් වෙලා ගැනීමට හා ජාතිකවාදය, මිලිටරිවාදය සහ ''නිදහස් ව්‍යවසායකත්වය'' වර්නනා කරන වාචාල කතාවලට ලැබෙන තවත් එක් අවස්ථාවකි.

මෙම නිවාඩු දිනය පිලිබඳව නිකුත් කෙරෙන නිල නිවේදනයන් එම දිනය සමරනුයේ කුමක් ද යන්න පිලිබඳ කවර හෝ බැරෑරුම් සලකා බැලීමකින් අනිවාර්යයෙන් ම තොර වනු ඇත: මෙදින සමරනු ලබන්නේ වරෙක මුලු මහත් ලොව පුරා ජනයා ප්‍රබෝධමත් කල නිදහස සඳහා වූ අරගලයකි.

දේශීය ආරක්ෂක ලේකම් ටොම් රිජ් නිවාඩු දිනයේ ඕනෑ ම විටක එල්ල විය හැකි ත්‍රස්තවාදී ප්‍රහාරයන් ගැන ව්‍යාජ අනතුරු ඇඟවීම් ගනනාවක් නිකුත් කල නමුදු එවන් දරුනු ප්‍රහාරයක් සිදු විය හැක්කේ කෙසේ ද, කවදා ද, කොතැන දී ද යන කිසිදු තොරතුරක් සැපයුවේ නැත.

එදින පවත්වන ගිනි කෙලි සංදර්ශන මගින් සංකේතවත් කෙරෙන්නේ කෲරත්වයට හා විජිතවාදයට එරෙහි සන්නද්ධ විප්ලවයක් යැයි යන කරුන මත කිසිවකුත් අවධාරනයක් යොදා නැත. ප්‍රථම ජුලි 4 දායින් අවුරුදු 228කට පසුව ද රටේ ඉතිහාසය තුල අන් කවර දාකටත් වඩා තියුනු ලෙස එම විප්ලවයෙන් පැන නැගුනු ප්‍රශ්න මතු කෙරෙයි.

නිවාඩු දිනය සලකුනු කරන්නේ 1776 දී අත්සන් තැබූ ඇමරිකාවේ නිදහස් ප්‍රකාශනය පිලිබඳ සංවත්සරය යි. සමානාත්මතාව හා ''උදුරා ගත නො හැකි අයිතීන්,'' සහ කෲරත්වයට එරෙහි විප්ලවයේ නීති යුක්ත භාවය ගැන ප්‍රකාශනයේ සඳහන් වන බැරෑරුම් ඉල්ලීම් ඊට ලෝක ඓතිහාසික වැදගත්කමක් උරුම කර දෙයි. පුනර්ජීවනය ප්‍රබුද්ධත්වයේ යුගයේ නිදහස්කාමී බුද්ධිමය, දේශපාලනමය හා සදාචාරමය සංස්කෘතිය මගින් උත්තේජනය වූ ඊට අත්සන් තැබූවෝ — විශේෂයෙන් ම එහි කතුවර තෝමස් ජෙෆර්සන් — සුවිශේෂ ඇමරිකානු ප්‍රඥප්තියක් ලෙස නො ව ආඥාදායකත්වයේ බලවේගයන්ට එරෙහිව නැගී සිටින ලෙස කල විශ්වීය කැඳවුමක් ලෙස ලියවිල්ල දැක ගත්හ.

ප්‍රකාශනය පිලිබඳව ජෙෆර්සන් මෙසේ පැවැසී ය: ''මා විශ්වාස කරන අයුරු, මෙය විසුලු සහගත මුග්ධත්වය ද අන්ධ විශ්වාසය ද නිසා තෙමේ ම බන්ධනගතව සිටින්නා වූ දම්වැල් පුපුරුවා හරිමින් ස්වයං-පාලනයක සුබිත භාවය හා සුරක්ෂිත භාවය සාක්ෂාත් කර ගනු වස් මිනිසුන් පුබුදුවා ලීම සඳහා ලෝකය වෙත (සමහර කොටස්වලට ඉක්මනින් ද අනෙක්වාට පසුව ද අවසානයේ සියල්ලට ම ද) නිකුත් කරන සංඥාවක් වනු ඇත. අප ආදේශ කොට ඇති ආකෘතිය කොන්දේසි විරහිතව අදහස් ප්‍රකාශ කිරීමේ ද සිතීමේ නිදහසේ ද නිදහස් අයිතිය යලි ස්ථාපනය කරයි. මිනිසාගේ අයිතීන් කෙරෙහි සියලු දෑස් විවරව හෝ විවර වෙමින් පවතී.''

ආරම්භයේ සිට ම මෙම ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් ද ඇමරිකානු සමාජ පද්ධතියේ යථාර්ථයන් ද අතර පවත්නා විසංවාදය ප්‍රතික්ෂේප කල නො හැකි විය. බ්‍රිතාන්‍ය රජුගෙන් වහල් වෙලඳාමට ලැබුනු සහයෝගය ''මනුෂ්‍ය ස්වභාවයට එරෙහි කුරිරු යුද්ධයක්'' ලෙස සහ ''තමාට කිසිදු වරදක් සිදු නො කල ඈත ප්‍රදේශයක මිනිසුන්ගේ ජීවත් වීමේ සහ පුද්ගල විමුක්තිය භුක්ති විඳීමේ උත්තරීතර අයිතීන්'' උල්ලංඝනය කිරීමක් ලෙස සඳහන් කෙරුනු හෙලා දැකීමක් ලියවිල්ලට අන්තර්ගත කිරීම සඳහා වර්ජිනියාවේ වහල් හිමියකු වූ ජෙෆර්සන් ම දැරූ උත්සාහය අසාර්ථක වීමෙන් මෙම කරුන මූර්තිමත් කෙරේ.

මුල් කාල පරිච්ඡේදයේ දී වහල් ක්‍රමය සමග සම්බන්ධව පැවති, ආර්ථික අසමානතාව හා සූරා කෑම මත පදනම් වූ සමාජයක් තුල ප්‍රකාශනයෙහි අඩංගු ප්‍රජාතාන්ත්‍රීය මූලධර්ම හා සමාජ යථාර්ථය අතර ගැටුම සමාජවාදය සඳහා අරගලයේ ද — අවලංගු

කිරීම්වාදයේ (abolitionism) සිට වැඩ කරන ජනතාවගේ අයිතීන් අහෝසි කිරීමට එරෙහි මහජන ව්‍යාපාරය හා ජිම් ක්‍රෝ වාර්ගිකව කොන් කිරීමට එරෙහි සිවිල් අයිතීන් සඳහා සටන වැනි — ඇමරිකානු ඉතිහාසය තුල පැවති සෑම සටනක ම ද ආරම්භක ලක්ෂ්‍යය වෙයි.

මෙම විසංවාදයන් මින් පෙර අද තරම් නග්න ආකාරයකින් නො පැවතුනි. ධවල මන්දිරයේ වර්තමාන පදිංචිකරු ජෝර්ජ් රජු වසයෙන් හඳුන්වන කෙලතොලු කතා තිබුනේ වී නමුදු දෙසිය වසරකටත් පෙර ජෙෆර්සන් ඇතුලු විප්ලවවාදීන් කෙටුම්පත් කල ප්‍රකාශනයේ ඇතුලත් වචන අද කියැවෙන්නේ බුෂ් පරිපාලනයට හා සමස්ත එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයට එරෙහි සාපරාධී චෝදනා පත්‍රයක් පරිද්දෙනි.

රාජාන්ඩු පාලනයේ ''දිව්‍යමය අයිතිය'' පිලිබඳ බ්‍රිතාන්‍ය රජුගේ මන්තරයට එරෙහිව නිදහස් ප්‍රකාශනයේ අවධාරනය කෙරුනේ, ''ආන්ඩු සංස්ථාපිත වන්නේ මිනිසුන් අතර ය, එම ආන්ඩුවල බලය නිෂ්පන්න වන්නේ පාලිතයන්ගේ කැමැත්ත මත ය'' යනුවෙනි. එහෙත් අද දින ඇමරිකානුවන් පාලනය කෙරෙන්නේ 2000 මැතිවරනය පිල්ලි ගසමින් මහජන මතය පාගා පිහිටුවනු ලැබූ, පාලිත බහුතරයක කැමැත්තෙන් තොරව බලය හොබවන ආන්ඩුවකිනි.

මෙම ආන්ඩුව ඉරාකය තුල ගෙන යන යුද්ධය හා විජිතවාදී ග්‍රහනය මගින් එරටෙහි මිලියන 25ක ජනතාව යටත්විජිතවාදී මර්දනයට යටත් කර ඇත්තේ 18වන සියවසෙහි ඇමරිකානු විජිතවාසීන්ට එරෙහිව මහා බ්‍රිතාන්‍ය ක්‍රියාත්මක කලාටත් වඩා දැඩි හා රුදුරු ආකාරයට ය. ඉරාකයට එරෙහි ආක්‍රමනය ද කොටසක් ලෙස සලකනු ලබන අවසානයක් නොමැති ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' නිදහස් ප්‍රකාශනයෙන් ද එක්සත් ජනපද ව්‍යවස්ථාවෙන් ද සහතික කෙරී ඇති මූලික ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් කටු ගා දැමීමේ නිමිත්ත ලෙස යොදා ගැනෙනු ඇත.

ප්‍රකාශනයෙහි තුන් වන ජෝර්ජ් රජුට එරෙහි විස්තර අඩංගු පනතේ ඔහුට එරෙහි පහත චෝදනාව ද අන්තර්ගත වේ: ''සිවිල් බලයෙන් ස්වාධීන වන අයුරින් සහ එයට අධිකාරවත් වන අයුරින් මිලිටරිය ඔසවා තැබීම සම්බන්ධයෙන් ඔහු වරදකරු වී තිබේ.''

කොන්ග්‍රසමය යුද ප්‍රකාශ කිරීමකින් තොරව දියත් කෙරුනු මිලිටරි මැදිහත් වීම්වල දිගු දාමයක් මගින් ප්‍රකාශයට පත් වූ ප්‍රතික්ෂේප කල නො හැකි ප්‍රවනතාවක් ලෙස මෙය දශක ගනනාවක් පුරා එක්සත් ජනපද දේශපාලන පද්ධතිය තුල පැවතිය ද බුෂ් පරිපාලනය බාධාවකින් තොරව ම පෙර නුවූ විරූ මට්ටම්වලට මිලිටරිවාදය නංවා ඇත. මිලිටරිය සිවිල් අධිකාරයට යටත් කිරීමේ මූලධර්මයට බුෂ් පරිපාලනය ක්‍රමානුකූලව වල කපා ඇත.

එය ජනාධිපති වෙත අසාමාන්‍ය බලතල ඉල්ලා ඇත්තේ ''අන දෙන ප්‍රධානයා'' වසයෙන් ඔහු සතු ප්‍රශ්න කල නො හැකි අභිමත පරිදි කටයුතු කිරීමේ හැකියාව මතු කරමිනි. එක්සත් ජනපදයට විරුද්ධව කිසිදු සතුරු ක්‍රියාවක නො යෙදුනු රටවලට එරෙහිව අප්‍රකූපිත ''ආරක්ෂනවාදී'' යුද්ධවලට යාම සඳහා ජාත්‍යන්තර නීතිය අභිභවා නිර්දයව ක්‍රියා කිරීමේ අයිතිය පරිපාලනය විසින් තහවුරු කෙරී ඇත. යුද සිරකරුවන්ට වධ දීම හා ඔවුන් මරා දැමීම යෝග්‍ය යැයි ජනාධිපතිට පෙනී යන්නේ නම් ඒ සඳහා නියෝග දීම පවා කල හැකි යැයි පරිපාලනයේ නීතිඥයෝ තර්ක කරති. කුප්‍රකට අබු ග්‍රයිබ් සිර කඳවුරෙහි හා වෙනත් එක්සත් ජනපද රැඳවුම් මධ්‍යස්ථානවල ක්‍රියාවට නගා ඇත්තේ මෙම අභූත න්‍යාය යි.

''ජූරි සභාවක් සහිතව නඩු විභාගවලට පෙනී සිටීමේ පහසුකම් බොහෝ අවස්ථාවල දී අපට අහිමි කර තිබේ'' යැයි ද ප්‍රකාශනය බ්‍රිතාන්‍ය රජු හෙලා දැක තිබේ. 5 හා 6 යන එක්සත් ජනපද ව්‍යවස්ථා සංශෝධනයන් මගින් චෝදනා ඉදිරිපත් කිරීමකින් හෝ නඩු විභාග කිරීමකින් තොරව මිනිසුන් සිරගත කිරීමේ ඒකාධිපති ක්‍රියාවන් නීති විරෝධී කර තිබේ. අයිතිවාසිකම් පනතේ මෙම කොටස්වලින් සහතික කර ඇති පරිදි ''නඩු විභාගයකට පෙර හෝ ජූරි සභාවක් ඉදිරියේ චෝදනාවන් ඉදිරිපත් නො කර කිසිදු පුද්ගලයකු අපරාධයකට ... පිලිතුරු සැපයීම සඳහා අත් අඩංගුවේ තබා ගත නො හැකි ය,'' ''අපක්ෂපාතී ජූරි සභාවක් ඉදිරියේ ඉක්මන් හා ප්‍රසිද්ධ නඩු විභාගයක් සඳහා පෙනී සිටීමේ අයිතිය එහි දී චූදිතයාට ලැබිය යුතු ය.''

බුෂ් පරිපාලනය ඊනියා ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' වෙනුවෙන් පවරා ගෙන ඇති බලතල ඉල්ලා සිටීමට හිටපු ජෝර්ජ් රජු පවා නිර්භය නො වනු ඇත. යම් පුද්ගලයකු ''සතුරු ප්‍රහාරකයකු'' ලෙස ප්‍රකාශ කිරීම මගින් — ජාත්‍යන්තර හෝ එක්සත් ජනපද නීතියෙහි පවා කිසිදු නිශ්චිත පදනමකින් තොර යෙදුමකි — ජනාධිපති හා ඔහුගේ උපදේශකයන් අවධාරනය කරන්නේ තමන්ට ඕනෑ ම අයකු ''අතුරුදන්'' කරවිය හැකි බව යි.

පුරවැසියන් මෙන් ම පුරවැසි නො වන්නන් ද චෝදනා රහිතව, විමසා බැලීම් හෝ පවුලේ සාමාජිකයන්ට පවා නො දන්වා සිර කොට තැබීමේ අයිතිය ඔවුහු ඉල්ලා සිටිති. මෙවන් රඳවා ගැනීම් සම්බන්ධ කිසිදු සීමාවක් ඔවුන් සලකන්නේ නැත. ඔවුන්ට අනුව රාජ්‍යයේ චූදිත සතුරන් අංශුමාත්‍ර සාක්ෂියක් ඉදිරිපත් කිරීමෙන් පවා තොරව ජීවිතාන්තය දක්වා සිරගත කල හැකි ය. අවශ්‍ය වන්නේ ජනාධිපති එය එසේ යැයි පැවසීම පමනි.

මෙම ප්‍රතිපත්තිය මත කියුබානු ගුවන්තනාමෝ බේහි හා වෙනත් තැන්වල රැඳවුම් කඳවුරු පුරවා ඇති අතර එක්සත් ජනපද පුරවැසියන් දෙදෙනකු නාවික හමුදා නෞකාවක් වෙත යවා තිබේ. සැප්තැම්බර් 11 දායින් පසුව එක්සත් ජනපදය තුල තවත් දහස් ගනනක් සංක්‍රමනිකයන් කොටු කෙරුනු අතර චෝදනා ඉදිරිපත් නො කොට රඳවා ගැනුනි.

බ්‍රිතාන්‍ය විජිතවාදයට එරෙහි විප්ලවය නීතියුක්ත කරන ප්‍රකාශනය තුල අඩංගු සමහර චෝදනාවන් සිය රටෙහි සිටින එක්සත් ජනපද ආක්‍රමනිකයාට එරෙහිව සන්නද්ධ විරෝධතා සටනක යෙදී සිටින ඉරාක වැසියන් පිලිබඳ ලියවිල්ලකට පහසුවෙන් ම ඇතුලත් කල හැකි ය.

''විශාල සන්නද්ධ හමුදා කන්ඩායම් හතරක් අපට එරෙහිව යෙදවීම'' පිලිබඳව 1776 දී ඇමරිකානු විජිතවාසීහු රජුට චෝදනා කලහ. දින නියමයක් නොමැතිව ඉරාකයේ රඳවා සිටින 140,000ක් පමන වූ එක්සත් ජනපද සොල්දාදුවන් හා නාවිකයන් දිනපතා ම මරමින් ද මැරෙමින් ද ගෙන යන විජිතවාදී යුද්ධයේ අරමුන ඉරාකය හා එහි තෙල් සම්පත් මත එක්සත් ජනපද ආධිපත්‍යය පිහිටුවීම යි.

ඇමරිකාව තුල දී සිදු කල අපරාධ සම්බන්ධයෙන් එල්ල වූ චෝදනාවලින් සිය හමුදාවන් සහ පරිපාලකයන් නිදහස් කලේ යැයි බ්‍රිතාන්‍ය අධිරාජයාට ප්‍රකාශනයෙන් චෝදනා කෙරින. ''මෙම ජනපදවාසීන් මරා දැමීම සම්බන්ධයෙන් කවර හෝ චෝදනාවකට වරදකරුවන් වී දඬුවම් ලැබීම වලකනු වස් ව්‍යාජ නඩු ඇසීම් මගින් ඔවුන්ට රැකවරනය ලබා දුන්නේ යැ''යි එය රජුට චෝදනා කරයි.

එක්සත් ජනපදය පත් කල රූකඩයන් වෙත විකාර සහගත ''ස්වෛරීත්වය පැවරීමට මඳ කලකට පෙර මොන ම අපරාධයක් සම්බන්ධයෙන් හෝ ඉරාක නීතිය යටතේ චෝදනා ලැබීමෙන් එක්සත් ජනපද හමුදාවන් හා කොන්ත්‍රාත්කරුවන් නිදහස් කරන පූර්න ආවරනයක් වොෂින්ටනය විසින් පැනවින. පහල මට්ටමේ සංචිත හමුදා නිලධාරීන් අතලොස්සකට චෝදනා එල්ල වී තිබෙන අතර ඒ සම්බන්ධිත ''ව්‍යාජ නඩු විභාග'' ආරම්භ කොට ඇත. අන දෙන නිලධාරීන් ඔවුන් ගැන සලකන්නේ වැය කල හැකි අය ලෙස ය. මෙසේ වන්නේ වධ දීම ධවල මන්දිරයෙන් සම්භව වන ක්‍රමානුකූල ප්‍රතිපත්තියක් බව පැහැදිලිව ඉස්මතුව තිබිය දී ඊට වගකිව යුත්තන් මුලුමනින් ම නිදහස් වී ඇති තතු තුල ය.

''මේ අවස්ථාවේ දී කුරිරුකම්, මිනී මැරීම් හා විනාශයන් ඇති කිරීම සඳහා විදේශ කුලී හේවායන්ගේ විශාල හමුදාවන් ප්‍රවාහනය කරමින් සිටින්නේ ය'' යනුවෙන් ප්‍රකාශනය ජෝර්ජ් රජුට චෝදනා නැගී ය. ඉරාක ආක්‍රමනයේ පෙර නො වූ විරූ ලක්ෂනය වන්නේ මහා පරිමානයෙන් කුලී භටයන් යොදා ගැනීම යි. ''සිවිල් කොන්ත්‍රාත්කරුවන්'' ලෙස වෙන් කර හඳුන්වන මොවුන් යොදා ගනු ලබන්නේ ද එවන් සාපරාධී කටයුතු සඳහා ය. සංඛ්‍යාත්මකව 20,000කට අධික යැයි ගනන් බලා ඇති, එක්සත් ජනපද හමුදාවට පසුව දෙවන විශාලතම සේනාංකය ලෙස සැලකෙන මොවුන් අතර හඳුනා ගත් යුද අපරාධකරුවෝ සිටිති. මෙයට දකුනු අප්‍රිකාවේ පැවති වර්ග භේදවාදී තන්ත්‍රය හා චිලියේ පිනෝචේ ඒකාධිපතියා යටතේ පුහුනුව ලත් ඝාතක කල්ලි ද ඇතුලත් වෙති.

මෙම හමුදා බලඇනි යොදා ගැනීමෙන් දේශපාලනික සබඳතා සහිත මිලිටරි කොන්ත්‍රාත්කරුවන්ගේ බැංකු ගිනුම් තර වීමට අමතරව කිසිවෙකුටත් වග නො කියන පුහුනු වධකයන් හා මිනීමරුවන්ගේ සංචිතයක් ද සැපයේ.

හුදෙක් අජීවී ලිපියක් බවට පත්ව ඇති නිදහස් ප්‍රකාශනයේ ඇතුලත් දීප්තිමත් අදහස් ද අද දින පවතින අභූත දේශපාලන යථාර්ථයන් ද අතර පවත්නා ඇස් නිලංකාර කරන ප්‍රතිවිරෝධයන්ගෙන් මෙය අවසානයකට ගෙන ඒම පහසු කරයි. දේශපාලන පද්ධතියේ ක්‍රමානුකූල දූෂනයත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් කාබාසීනියා කිරීමත් මගින් 1776 විප්ලවවාදී සම්ප්‍රදායන් දිගු කලකට පෙර ම නිවාරනය කර ඇති බව පෙන්නුම් කරයි. පෘථිවි ගෝලය හරහා මහජනතාවන් සඳහා නම් ඇමරිකාව මගින් සංකේතවත් වන්නේ ජෙෆර්සන්ගේ ප්‍රබෝධනය වන ප්‍රජාතන්ත්‍රවාදය හා සමානතාව නො ව බුෂ්ගේ ආක්‍රමනකාරීත්වය, සමූහ ඝාතන හා වධ දීම් ය.

එහෙත් ඇමරිකාවන් දෙකක් තිබේ. රටේ සමාජ යටිතල පහසුකම් විනාශ කිරීම හා යුද්ධය වැනි සාපරාධී ව්‍යවසායන්ගෙන් ආඪ්‍ය වූ අත්‍යධික ලෙස ධනවත් මූල්‍ය කතිපයාධිකාරය හෙවත් බුෂ්ගේ ඇමරිකාව එකකි. කෝටිපතියන්ගේ හා ප්‍රකෝටිපතියන්ගේ මෙම කල්ලිය තම අවශ්‍යතාවන්ට විශ්වාසවන්තව සේවය කරන ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් යන දෙපක්ෂය ම පාලනය කරයි.

අනෙක් ඇමරිකාව වැඩ කරන ජනතාවගේ රටකි. ලෝකයේ සෑම අස්සක් මුල්ලකින් ම වඩ වඩාත් ඇද ගනු ලැබූ ජනගහනයෙන් අතිබහුතරයක් වන මෙම ඇමරිකානුවන් ජීවත් වන්නේ පඩිපතෙන් පඩිපතට ය. ඔවුන්ගේ සියලු අපේක්ෂාවන් හා බලාපොරොත්තු ද්වි-පක්ෂ ක්‍රමය විසින් අහෝසි කර දැමී ඇත. ඉරාකයේ දී දහස් ගනනින් ආබාධිත වූ හා 900ක් පමන මිය ගියා වූ එක්සත් ජනපද හමුදාවේ විශාල වැඩි කොටස නියෝජනය කරන්නෝ ආර්ථික අවශ්‍යතාවන් විසින් මිලිටරිය වෙත ඇද ගනු ලැබූ ඔවුන්ගේ දරුවෝ ය.

රටේ ප්‍රාරම්භක ලියවිලිවල අඩංගු ප්‍රජාතාන්ත්‍රීය මූලධර්මයන් පවත්වා ගැනීම කල නො හැකි දෙයක් බවට පත් කොට ඇත්තේ මෙම ඇමරිකාවන් දෙක එකිනෙකින් වෙන් කරන පෙර නො වූ විරූ අගාධය යි. සමාජ ධ්‍රැවාන්තගත වීම කිසි විටෙක මෙතරම් බැරෑරුම් වී නොමැත. මෑතක දී කරන ලද ෆෙඩරල් රිසර්ව් දත්ත විශ්ලේෂනයකට අනුව පසු ගිය විසි වසර තුල ජනගහනයේ ඉහල ම සියයට 1 ඔවුන්ගේ මූල්‍ය ධනය දෙගුනයකට වඩා ඉහල දමා ගෙන ඇති අතර පහල ම සියයට හතලිහ දැක ඇත්තේ සිය ධනය සියයට 46කින් පහල වැටී ඇති බව යි.

ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පරිපාලනයන් එක ලෙස ක්‍රියාත්මක කල සමාජ ප්‍රතිපත්තීන්ගේ නිෂ්පාදිතයක් ලෙස සිදු වූ ආර්ථික අසමානතාවේ නාටකාකාර වැඩී යාම හේතුවෙන් මූල්‍ය ප්‍රභූව ද ජීවත්

වීම සඳහා වැඩ කරන ඇමරිකානුවන් බහුතරය ද යන දෙකොටසෙහි ම අවශ්‍යතාවන්ට බලපාන කිසිදු ප්‍රධාන දේශපාලන ප්‍රශ්නයක් සඳහා වත් ප්‍රතිපත්තියක් කෙටුම්පත් කල නො හැකිව තිබේ. එවන් ක්‍රමයකට මහජනතාව අමු අමුවේ රැවටීමත් සියලු අව්‍යාජ දේශපාලන සාකච්ඡාවන් යටපත් කිරීමත් අවශ්‍ය වේ. ඇමරිකානු නිදහස සඳහා අරගලයෙන් සහතික කල ඉතිරිව ඇති සෑම ප්‍රජාතාන්ත්‍රීය අයිතියක් ම විනාශ කිරීම එය අවසන් වසයෙන් ඉල්ලා සිටියි.

බුෂ්ට හා ඔහුගේ ඩිමොක්‍රැටික් සහකරුවන්ට තමන් හඬ නගන ''නිදහස'' හා ''ප්‍රජාතන්ත්‍රවාදය'' යන වචන හුදෙක් රට තුල එක්සත් ජනපද සංගත ආධිපත්‍යය ගොඩ නගා ගැනීමත් අනෙකුත් රටවල් අසීමිතව සූරා කෑමත් සඳහා වන සංකේත වචන දෙකක් පමනකි. එහෙත් ඇමරිකානු වැඩ කරන ජනතාවට නම් ඒවායෙහි ඇත්තේ බෙහෙවින් වෙනස් අර්ථයකි. බොරු මත පදනම් වූ සාපරාධී යුද්ධයකට රට ඇද දැමූ, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්වයන් විනාශයේ හෙලමින් සිටින, සුපිරි ධනපතියන් අතලොස්සකගේ අවශ්‍යතාවන් වෙනුවෙන් පමනක් ආන්ඩුව ගෙන යන පාලනයක් දසලක්ෂ සංඛ්‍යාත ඇමරිකානුවන් කෝප ගන්වයි.

පවත්නා දේශපාලන සැකැස්ම තුල මෙම කෝපයට ප්‍රකාශනයක් සොයා ගත නො හැකි ය. පාලක ප්‍රභූව තුල දැන් ඇවිල තිබෙන කටුක විවාදය පදනම්ව ඇත්තේ අධිරාජ්‍යවාදී ආක්‍රමනකාරිත්වය, ඉහල ම කොටස අත සමුච්චය වන වැඩි වෙමින් පවත්නා ධන සම්භාරය හෝ සිවිල් නිදහසේ ජයග්‍රහනයන් පැහැර ගැනීම වැනි අත්‍යවශ්‍ය කරුනු මත නො වේ. ඒ වෙනුවට එය යොමුව ඇත්තේ සංගත ඇමරිකාවේ කටයුතු හැසිරවීමට වඩාත් ම සමත් ප්‍රධාන විධායක නිලධාරියා බවට පත් වනුයේ කවර අපේක්ෂකයා ද යන්න ගැන ය. එලඹෙන 2005 වසරේ දී ධවල මන්දිරයේ සිටින්නේ බුෂ් ද කෙරී ද යන්න නො තකා එම අත්‍යවශ්‍ය ප්‍රතිපත්තීන් ම ඉදිරියටත් ක්‍රියාවට නැගෙනු ඇත.

සමාජවාදී සමානතා පක්ෂය 2004 මැතිවරනයන්ට ඉදිරිපත්ව සිටින්නේ එබැවිනි. මාගේ හා කොන්ග්‍රසයට තරග වදින සසප අපේක්ෂකයන්ගේ මැතිවරන උද්ඝෝෂනයේ අරමුන වන්නේ යුද්ධයට, සමාජ ප්‍රතිගාමිත්වයට හා ප්‍රජාතාන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ට ද එරෙහිව සටන් වැදීම සඳහා ස්වාධීන දේශපාලන හඬක් ද ඉදිරි දර්ශනයක් හා ක්‍රියා මාර්ගයක් ද කම්කරු පන්තියට සම්පාදනය කිරීම යි. ඇමරිකානු විප්ලවයේ උරුමයෙන් ඉතිරිව ඇති ප්‍රගතිශීලිත්වයේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ යමක් වේ ද එය ආරක්ෂා කල හැක්කේ ද ඉදිරියට ගෙන යා හැක්කේ ද සමාජවාදය සඳහා අරගලය කරා ඇමරිකානු කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන්වීමෙන් පමනක් ය යන අවබෝධයකින් අපි පටන් ගන්නෙමු.

නිදහස් ප්‍රකාශනයෙන් නිධන්ගත කරනු ලැබුවේ මහජනතාවගේ ''අනුල්ලංඝනීය අයිතීන් හි'' මග හරස් කරන ඕනෑ ම වර්ගයක ආන්ඩුවක් ''වෙනස් කිරීමට හෝ අහෝසි කිරීමට'' සහ ''සිය ආරක්ෂාව හා සතුට බෙහෙවින් ම සැලසෙනු ඇතැයි ඔවුන්ට පෙනී යන'' වෙන ම පද්ධතියක් මගින් එය විස්ථාපනය කිරීමට ඇති අයිතිය ය යන්න මෙම ජූලි 4 වන දා සිහිපත් කිරීම වටනේ ය. සමාජවාදී සමානතා පක්ෂයේ අපි ඇමරිකානු වැඩ කරන ජනතාව මෙම අයිතිය ක්‍රියාවට නගනු ඇතැයි විශ්වාස කරන්නෙමු: ඔවුන් ලෝකය පුරා ම කම්කරුවන් සමග තවත් විප්ලවයක් සඳහා ඒකාබද්ධ වනු ඇත, මෙවර එය ධනවාදය අවසන් කරන හා සමානාත්මතාව, මානුෂික සහයෝගිතාව හා මිනිස් වර්ගයා දරිද්‍රතාවෙන් හා පීඩනයෙන් මුදා ගැනීමේ සාමූහික අරගලයක් මත පදනම් වූ නව සමාජ පර්යායක් නිර්මානය කරන විප්ලවයක් වනු ඇත.

© www.wsws.org